දොළොස්වන වෙළුම (2025 ජනවාරි - දෙසැම්බර්)

A CSR Project by
Sputnik International Sri Lanka Organization (SISLO)

ස්පුට්නික් බාලිකා නිවාසයේ එදිනෙදා විශේෂ සිදුවීම් වාර්තාව
(Sputnik Girls' Home Newsletter)

අප ස්පුට්නික් බාලිකා නිවාසයේ යහපත සහ අභිවෘද්ධිය වෙනුවෙන් නිරතුරු කැපවී සිටින ඔබ සැමට අපගේ කෘතඥතාවය පළ කර සිටිමු. අප දියණියන්ගේ වත්මන් තොරතුරු පිළිබඳව දැන ගැනීමට ඔබ සැම කැමැත්තෙන් පසුවනු ඇතැයි සිතමු. එබැවින් “Sputnik Girls' Home Newsletter” හි දොළොස්වන වෙළුම තුළින් මෙසේ ඔබ හමුවට පැමිණෙන්නෙමු.

037-222-8965

donations@sputnik.lk
https://sputnik.lk/girlshome/

Sputnik Girls' Home,
Kanumale, Uhumeeya,
Kurunegala.

@manojmalaka

2025.01.01

අපි ජනවාරි අලුත් අවුරුද්ද සතුටින් සැමරූ අතර, නව වසර ප්‍රීතියෙන් පිළිගත්තෙමු.

2025.01.18

දියණියන් සහ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා නුවරඑළිය චාරිකාවට සහභාගි විය. එහිදී තේ ෆැක්ටරිය, අඹේවෙල ගොවිපොළ, හග්ගල උද්භිද උද්‍යානය සහ ග්‍රෙගරි වැව නැරඹීමට යන ලදී. දියණියන් සියලු දෙනා ඉත්මත් සතුටෙන් සහ උද්යෝගයෙන් යුතුව දිනය ගත කරන ලදී.

2025.01.19

සෞඛ්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් සහ අරුනළු පුනරුත්ථාපන ඒකකයේ සාමාජිකයින් අප දියණියන් හමුවීමට පැමිණියහ. පසුව ඔවුන් බාලිකා නිවාස පරිශ්‍රය තුළ ඇති හරිත ශක්ති පුහුණු අධ්‍යාපන මධ්‍යස්ථානය සහ කාබනික ගොවිපලද නැරඹූහ.

2025.01.25

මිස් ෂම්මි, බාලිකා නිවාසයේ ප්‍රධාන පාලිකාව සහ එහි කළමනාකරු වන වසන්ත මහතා, (**Advanced Certificate in Human Rights - Based Approach To Case Management and Care of Child Victims Of Human Trafficking** පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම වෙනුවෙන් ඔබ දෙපළට උණුසුම් සුබපැතුම්!

2025.01.27

UK ජාතිකයන් පිරිසක් බාලිකා නිවාසයේ ස්වේච්ඡා සේවයේ නිරත විය.

@manojmalaka

2025.02.20

ස්පුට්නික් බාලිකා නිවාසයේ 18 වන සංවත්සරය සඳහා පුහුණුවීම්වල නිරතවන දියණියන්.

2025.02.23

18 වන සංවත්සර සැමරුම. මේ සඳහා අප බාලිකා නිවාසය ආරම්භයේ සිට මේ දක්වා සහය දැක්වූ දානපතීන්ද සහභාගි විය. අප දියණියන්ගේ නැටුම් ගැයුම්වලින් උත්සවය වර්ණවත් විය.

2025.03.06

- ජපන් සිසු පිරිසක් බාලිකා නිවාසය නැරඹීමට පැමිණීම.
- ජපන් ජාතික නවතො මහතා බාලිකා නිවාසයේ වගා කටයුතුවල නිරත වීම.

2025.03.17

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන් අප දියණියන්ට සුභ පැතුම්!

2025.03.26

අප බාලිකා නිවාස පරිශ්‍රයේ ඇති හරිත ශක්ති පුහුණු අධ්‍යාපන ආයතනය නැරඹීමට පැමිණි Dragon Trip කණ්ඩායම.

@manojmalaka

2025.03.27

ලූර්දු ළමා නිවාසයේ දැරියන් හා කාර්ය මණ්ඩලය, හරිත ශක්ති පුහුණු අධ්‍යාපන ආයතනය නැරඹීමට පැමිණ අප දියණියන් සමගින් සතුටින් දිනය ගත කළහ.

2025.04.14

පුංචි අපේ අවුරුද්දට සතුට හා අවුරුදු සිරිය රැගෙන කුමාර මාමලා පැමිණීමෙන් අපේ සිත් ප්‍රීතියෙන් පිරී ගියේය.



2025.05.09

වෙසක් පොහොය නිමිත්තෙන් සුමනසාර විදුහලේ සිට ගංගාරාම විහාරස්ථානය දක්වා පැවැත්වූ පෙරහැරට අප දියණියන්ද සහභාගි විය.

@manojmalaka

2025.05.17

අචාර්ය නිහාල් සෙනරත් මහතා විසින් “මානසික ආතතියෙන් තොර ජීවිතයක් ගත කරමු” යන මාතෘකාව යටතේ අප දියණියන් වෙනුවෙන් වැසටහනක් පවත්වන ලදී.

2025.06.08

ස්පුට්නික් බාලිකා නිවාස පුස්තකාල ළමා සමාජය පැවැත්වීම හා බැති ගී ප්‍රසංගය.

2025.07.11

අද දින 10 වන උපන් දිනය සැමරූ පබෝදා නවෝද්‍යා දියණියට සුභ උපන් දිනයකට ආසිරි ප්‍රාර්ථනා කරන අතර, ඇයට උපන් දින කේක් ලබා දුන් අජිත් මහතා සහ එම මහත්මියට අපගේ හද පිරි ස්තූතිය.

@manojmalaka

2025.07.16

S. M. සමන්ත බණ්ඩාර මහතා විසින් සද්ධර්ම වර්ෂා වැඩසටහනට අනුග්‍රහය දැක්වීම.

2025.07.17

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය උසස් ලෙස සමත් වූ අප දියණියන්ට උණුසුම් සුබ පැතුම්!

2025.07.18

ESOFT Metro Campus 17 වන කණ්ඩායම විසින් පරිස්සමින් මල් පිපීම තේමාව යටතේ වැඩසටහනක් පැවැත්වීම. වීරඹුගෙදර ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ප්‍රදාන හෙද සොයුරිය විසින් මේ සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

@manojmalaka

2025.07.26

අද දින 15 වන උපන් දිනය සැමරූ ශෂිකලා කුමුදුනී දියණියට සුභ උපන් දිනයකට ආසිරි ප්‍රාර්ථනා කරන අතර, ඇයට උපන් දින කේක් ලබා දුන් අජිත් මහතා සහ එම මහත්මියට අපගේ හද පිරි ස්තූතිය.

2025.08.08

අද දින 16 වන උපන් දිනය සැමරූ නදීෂා සෙව්වන්දි දියණියට සුභ උපන් දිනයකට ආසිරි ප්‍රාර්ථනා කරන අතර, ඇයට උපන් දින කේක් ලබා දුන් අජිත් මහතා සහ එම මහත්මියට අපගේ හද පිරි ස්තූතිය.

2025.08.10

අප දියණියන් ශිෂ්‍යත්ව විභාගයට පෙනීසිටි අතර ඔවුන්ට අපගේ උණුසුම් සුභ පැතුම්.

2025.09.27

නිවාස සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කරන ලද ලෝක ජනාවාස දිනය නිමිති කරගෙන පවත්වනු ලැබූ චිත්‍ර තරගාවලියෙ පළමු වටයෙන් තේරී පත් වූ දැරියන් කොළඹ විහාර මහා දේවි උද්‍යානයේ පවත්වන ලද තරගයට සහභාගි විය.

2025.09.30

පාසල් මට්ටමින් පවත්වන ලද වයඹ විසුල මිණි සාහිත්‍ය තරගාවලියේ ජ්‍යෙෂ්ඨ අංශයේ චිත්‍ර තරගාවලියෙන් ප්‍රථම හා දෙවන ස්ථාන දිනාගත් සෙව්වන්දි හා විලාදි දියණියන් හට උණුසුම් සුභ පැතුම්.

@manojmalaka

2025.10.01

පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තුමේන්තුව විසින් ලෝක ළමා දිනය වෙනුවෙන් සංවිධානය කළ කුරුණෑගල සිට ගාලු කොටුව දක්වා දුම්රිය විනෝද චාරිකාව

2025.10.23

ජනාධිපති පරිසර සම්මානයෙන් ස්පුට්නික් ආයතනය පිදුම් ලැබීය.

2025.10.27

කාර්ය සාධන තරගාවලිය - 2025 අධීක්ෂණ කටයුතු සඳහා විනිසුරුවරුන්ගේ පැමිණීම.

2025.11.13

නයිනමඩම ජෝසප් වාස් ළමා සංවර්ධන මධස්ථානයේ දියණියන් සහ කාර්ය මණ්ඩලය අප ළමා නිවාසයට පැමිණි අතර ඔවුන් තිරසාර සංවර්ධන ඉලක්ක (**Sustainable Development Goals – SDGS**) පිළිබඳව දැනුවත් කිරීම සහ එහි තොරතුරු පෙන්වීම.

@manojmalaka

2025.11.13

කාර්ය සාධන තරගාවලිය 2024/2025 ස්පුට්නික් ළමා සංවර්ධන මධස්ථානය රන් සම්මානයෙන් පිදුම් ලැබීය.

2025.11.14

සුමනසාර කලා ප්‍රතිභා 2025 විද්‍යාලයීය විවිධ ප්‍රසංගය, ත්‍යාග හා සහතික පත් ප්‍රදාන උත්සවය, එදින අප දියණියන් ඔවුන්ගේ කලා හැකියාවන් පෙන්නුම් කළ අතර ත්‍යාග සහතික පත්ද ලබා ගන්නා ලදි.

2025.12.27

නත්තලට සමගාමීව අබාන්ස් ආයතනය විසින් ජල පෙරනයක් පරිත්‍යාග කරන ලදී.

@manojmalaka

"Sputnik Girls' Home Newsletter" දහතුන්වනවන වෙළුම තුළින් නැවත හමුවෙමු.
ඔබ සැමට නිදුක් නිරෝගී සුව, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමු !!!

for Donations ☞ [https://sputnik.lk/365]

037-222-8965

donations@sputnik.lk
www.sputnik.lk

Sputnik Girls' Home,
Kanumale, Uhumeeya,
Kurunegala.

@manojmalaka